# OPERATIONS MANAGEMENT (Part-VIII)

*S. Madushanka*

*B.Sc (Mgt) Accounting (Special) (U.G)*

*University of of Sri Jayewardenepura*

## ගුණාත්වය (Quality)

ගුණාත්වය (Quality) නැතහොත් තත්ත්වය යනුවෙන් අදහස් කෙරෙන්නේ පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමට භාණ්ඩයකට හෝ සේවාවකට ඇති හැකියාවයි.

## භාණ්ඩ ගුණාත්වයෙහි අංගෝපාංග

- මනා ක්‍රියාකාරිත්වය
- කල් පැවැත්ම
- විශ්වාසවන්ත භාවය
- ප්‍රමිතියට අනුකූල වීම
- උචිත බව
- ආරක්ෂිත බව

ගුණාත්වයට බලපාන අංගෝපාංග භාණ්ඩයේ හෝ සේවාවේ හෝ ස්වභාවය අනුව වෙනස්වේ.

ClassWork.LK

## ගුණාත්ව පාලනය

නිෂ්පාදන ආයතනයක් විසින් ස්ථාපිත කෙරෙන ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදනය සිදු වන්නේ ද යන්නත් අවම නෛතික අවශ්‍යතාවලට අනුව නිෂ්පාදනය සිදු කරනු ලබන්නේ ද යන්නත් තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය තත්ත්ව පාලනය හෙවත් ගුණාත්ව පාලනය යනුවෙන් හැඳින්වේ.

## ගුණාත්ව පාලනය සඳහා යොදා ගනු ලබන ක්‍රියාමාර්ග

- නියැදි පරීක්ෂාව
- යෙදවුම් නිමැවුම් පරීක්ෂාව

ClassWork.LK

## ගුණාත්ව පාලනයෙහි වැදගත්කම

පහත සඳහන් හේතු මත ආයතනයකට ගුණාත්ව පාලනය වැදගත් වේ.

- නියමිත ගුණාත්වයෙන් යුතු භාණ්ඩ සැපයිය හැකි වීම.
- හානි වීම් හා පළුදුවීම් අඩු කර ගැනීමට හැකිවීම නිසා අපතේ යාම අඩු කර ගත හැකි වීම.
- තරඟකාරිත්වයට සාර්ථක ව මුහුණ දීමට හා අඛණ්ඩව වෙළෙඳ පොළ තුළ රැඳී සිටීමට හැකි වීම.
- පාරිභෝගික තෘප්තිය උපරිම වීම නිසා පාරිභෝගික හා පක්ෂපාතිත්වය වර්ධනය වීම.

ClassWork.LK

- නෛතික තත්ත්වයන් අනුව කටයුතු කළ හැකි වීම.

- ලාභදායිත්වය වර්ධනය වීම හා ව්‍යාපාරයේ පැවැත්ම ස්ථාවර වීම

- ආයතනයේ සමස්ත පිරිවැය අවම වීම

- වෙළෙඳ පොළට පහසුවෙන් පිවිසිය හැකි වීම

ClassWork.LK

# <u>තත්ත්ව පාලනය සඳහා භාවිතා කළ හැකි ශිල්පීය ක්‍රම</u>

තත්ත්ව පාලනය සඳහා භාවිතා කළ හැකි ශිල්පීය ක්‍රම කීපයක් පහත දැක්වේ.

- තත්ත්ව කව - Quality Circles
- ශූන්‍ය දෝෂ - Zero Defects
- තත්ත්ව ආරක්ෂණය - Quality Assurance
- ගුණාත්ව ප්‍රමිති - Quality Standards
- සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනය - Statisticals Process Control

ClassWork.LK

## තත්ත්ව කව

එක ම කාර්යක නියැළි සේවකයන් කුඩා කණ්ඩායම් වශයෙන් එක් වී සාකච්ඡා මගින් ඔවුන් මුහුණ පාන ගැටලු (රැකියාව හා කාර්ය සම්බන්ධ) හඳුනා ගෙන ඒ සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම තත්ත්ව කව මගින් සිදු වේ.

## ශුන්‍ය දෝෂ ක්‍රමය

සෑම නිෂ්පාදිතයක් ම දෝෂවලින් තොර ව නිෂ්පාදනය කෙරෙන බව සහතික කිරීම ශුන්‍ය දෝෂ ක්‍රමය ලෙස හැඳින්වේ. ඒ අනුව යම් වරදක් වැළැක්විය නොහැකි යැයි පිළිගැනීමට වඩා ප්‍රථම වතාවට ම නිවැරදි ව කිරීමට වග බලා ගැනීම ශුන්‍ය දෝෂ ශිල්ප ක්‍රමය මගින් සිදු කෙරෙයි.

ClassWork.LK

# තත්ත්ව ආරක්ෂණය

නිෂ්පාදිතයේ ගුණත්වය තහවුරු කර ගැනීම සඳහා නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අදියරක් ම විධිමත් පරීක්ෂාවකින් යුතු ව සිදු කිරීමට ගනු ලබන ක්‍රියා පිළිවෙත් තත්ත්ව ආරක්ෂණය ලෙස හැඳින්වේ.

මෙහි අරමුණ වන්නේ ගැටලු සෙවීමට වඩා ගැටලු සිදුවීම් වැළැක්වීම යි.

භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ දී තත්ත්ව පාලක පරීක්ෂකවරුන් විසින් සිදු කරනු ලබන පාලනයට අමතර ව සේවකයන් විසින් තමන් ඉටු කරන කාර්ය පරීක්ෂාවට ලක් කිරීම නිෂ්පාදන සඳහා වගකීම් සහතික ලබා දීම, ජාතික හා අන්තර්ජාතික ප්‍රමිති ලබා ගැනීම මඟින් මෙම කාර්ය සිදු කරනු ලබේ.

ClassWork.LK

## ගුණාත්ව ප්‍රමිති

ජාතික හෝ අන්තර්ජාතික ප්‍රමිතිවලට අනුව නිෂ්පාදන කටයුතු සිදු කිරීම, ගුණාත්ව ප්‍රමිති අනුගමනය කිරීම යන්නෙන් අදහස් වේ. එමඟින් ගුණාත්වය පිළිබඳ ව පාරිභෝගිකයාගේ විශ්වාසය දිනා ගත හැකිවේ.

## සංඛ්‍යානමය තත්ත්ව පාලනය

නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්ය සාධනය පිළිබඳ ව දත්ත රැස් කර ඒවා රූප සටහන්, වගු හා ප්‍රස්තාර මඟින් අදාළ පාර්ශ්ව වෙත සන්නිවේදනය කිරීම සංඛ්‍යානමය තත්ත්ව පාලනයේ දී සිදු කෙරේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura